# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❋ 2016 ඔක්තෝම්බර් ❋ මෙත් සවිය දහහතර වන කාණ්ඩය ❋ විසිනම වන කලාපය

METHSAVIYA NEWSLETTER

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා



ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම
මෙත් සවිය විසින් අරඹන ලදී.

ඇස්තමේන්තු ගත මුදල
**රුපියල් ලක්ෂ 350 ක්**
පමණ වේ.

**වර්ෂ 2016 සැප්තැම්බර් මස දී ගන්නා ලද බුද්ධප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ ඡායාරූප කිහිපයක්...**



## මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.

දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපැල : office@methsaviya.org


## මෙත් සවිය 2015 වසර සඳහා පත් වූ විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

ගරු පැවිදි අනුශාසක, ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත,
වංසාලංකාර අමරපුර නිකායේ
ගරු අධිකරණ සංඝනායක
අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා
අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී
මහාචාර්ය චන්දන ජයරත්න මහතා.
දු.ක : 0714800800 ෆැක්ස් : 0115678000
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපතිවරු**

වෛද්‍ය කාංචන ඇලපාත මහතා.
වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා.

**ගරු සම ලේකම්වරු**

එච්. එම්. චින්තක බණ්ඩාර මහතා.
දු.ක : 0718114477
කෝසල එදිරිසිංහ මහතා.
දු.ක : 0716322306

**ගරු භාණ්ඩාගාරික**

චමින්ද ඉන්දික මහතා.
දු.ක : 0712299212

**ගරු උප භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා.

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා
දු.ක : 0712285680

**ගරු කාරක සභිකවරු**

සම්පත් රත්නතිලක මහතා
මෙනුර ඩයස් මහතා
දර්ශන ගලප්පත්ති මහතා
ඩබ්. පී. සී. විතාන මහතා
ජගත් ප්‍රසන්න මහතා
ප්‍රදීප් යහම්පත් මහතා

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

මංජුල පද්මකුමාර මහතා

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඳුගොඩ මහත්මිය

**තරුණ කමිටුව - සභාපති**

ප්‍රසාද් අබේසිංහ මහතා

**අසරණ සරණ කමිටුව - සභාපතිනිය**

ශ්‍යාමා සමරවීර මෙනවිය

**සුව සෙත කමිටුව - සභාපති**

ප්‍රභාත් විජේසිංහ මහතා

## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහතුනකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි.** වර්තමාන සාමාජික සංඛ්‍යාව 4500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරනය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යයාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය පවත්වා ගනිමින් **"මෙත් සවිය"** මෛත්‍රී සංසදය පසුගිය දහතුන් වසර පුරා සමථ විපස්සනා භාවනාව හාරදහස් පන්සීයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදිප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදිපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහි වන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 35 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

35 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන 2016 ඔක්තෝම්බර් මස 23 වන දින ඇරඹීමට නියමිතය.

## 2016 නොවැම්බර් 06 වන ඉරු දින මාසික රැස්වීම

සෑම මසකම පළමුවැනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන් ම (දාන - සීල - භාවනා වැඩසටහන් සඳහා සඳහම් චාරිකාවේ නොයෙදෙන දිනයන් හිදී) මාසික රැස්වීම සහ විශේෂ දේශනය කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීම් ලැබුන ද, නොලැබුන ද, සෑම මසක ම පළමුවැනි ඉරුදින ඉහත මාසික රැස්වීම වැඩසටහන් සඳහා ප.ව. 2 - 4 අතර කාලය තුළ පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

අපගේ මීළඟ ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන 2016/11/06 දින, ප.ව. 2 - 3 දක්වා **"ලෝක විෂය, විශ්වයේ සම්භවය, ලෝකයේ සත්ත්වයාගේ හටගැනීම හා ලෝක විනාශය බුදු නෙතින් හා විදු නෙතින්"** දේශනය මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් පවත්වන අතර ඉන් පසුව ප.ව. 3 - 4 දක්වා අත්තනගල්ල බෝපාගම මිගදාය තපෝවනයේ ප්‍රධාන අනුශාසක, **භාවනා කම්මට්ඨානාචාර්ය ගම්පහ පාසාදික ස්වාමීන් වහන්සේ විසින් ධර්ම දේශනය** පැවැත්වීමට නියමිත ය.

## 2016 දෙසැම්බර් 04 වන ඉරු දින මාසික රැස්වීම

ග්‍රන්ථ රැසක කතෘ වන මහාචාර්ය දයාරෝහණ අතුකෝරාළ මහතා විසින් පවත්වනු ලබන **"ජීවිතය ජයගන්නා අන්දම පිළිබඳ මනෝවිද්‍යාත්මක පුද්ගල ප්‍රවර්ධන දේශනය"** ප.ව. 2 - 4 දක්වා කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. මෙම දේශනයට සියළු දෙනාගේම පැමිණීම බලාපොරොත්තු වේ.

## 2017 වසර සඳහා නොමිලයේ බෙදා හරිනු ලබන මෙත්සවිය දින දර්ශනය

2017 වසර මෙත් සවිය දින දර්ශනය 2016 දෙසැම්බර් 04 වන ඉරුදින කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වෙන පළමුවැනි ඉරුදින මාසික රැස්වීමේ දී සහ ඉන් පසුව මෙත් සවිය කාර්යාලයෙන් ලබාගත හැකිය.

## 2017 ජනවාරි 01 වන දින වසරේ ප්‍රථම හීල් දානය

2017 ජනවාරි මස 1 වන දින කොළඹ හුණුපිටියේ ගංගාරාම විහාරස්ථානයේ දී වර්ෂ ආරම්භය නිමිති කොට ගෙන පවත්වනු ලබන හීල් දානමය පුණ්‍යකර්මය සඳහා සහභාගී වීමට කැමති මෙත් සවිය සාමාජිකයන් එදින පෙ.ව. 6.00 ට ගංගාරාම වෙත පැමිණිය යුතුය. **පෙ.ව. 6.30 ට කේෂධාතූන් වහන්සේ වෙත බුද්ධ පූජාව පැවැත්වේ.**

**පෙ.ව. 7.00 ට මහා සංඝ රත්නය විෂයෙහි හීල් දානය පැවැත්වේ.** මේ සඳහා අවශ්‍ය කිරිබත්, ලුණු මිරිස්, ඉඳිආප්ප, පරිප්පු, අල හොදි, සීනි සම්බෝල, රතු/සුදු බත්, පොල් සම්බෝල, එලවළු ව්‍යංජන, මුං ඇට, පළතුරු, කැවිලි, පිරිකර ආදී දානමය ද්‍රව්‍ය භාර ගැනීමට කැමති පිංවතුන් ඇත්නම් අමතා තොරතුරු ලබාගන්න. දාන සංවිධායක, වික්‍රම මහතා - 0712 210 620 හෝ කාර්යාලය - 0714 014 467 අමතා තොරතුරු ලබාගන්න.

## 2017 ජනවාරි 01 වන දින පෙ.ව. 11.30 සිට ප.ව. 12.30 දක්වා ජයන්ති ළමා නිවාසයට දානය

කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනයට චම්පස යාබද පාරේ පිහිටි ජයන්ති ළමා නිවාසයේ දී (වසර 5 ට අඩු අසරණ ළමුන් සිටින) ළමයින් සඳහා දහවල් දානය සහ අත්‍යවශ්‍යය භාණ්ඩ පරිත්‍යාග කිරීම. 2017 ජනවාරි මස 1 වෙනි ඉරුදින පෙ.ව. 11.30 ට මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

**මෙදින සවස 2.00 ට සිරිත් පරිදි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වෙන වැඩසටහන නොපැවැත්වේ.**

## 2017 ජනවාරි 22 වන දින වෛද්‍ය කඳවුර

විශේෂඥ වෛද්‍යවරුන් සහභාගී වන නොමිළයේ රෝග විනිශ්චය කර බෙහෙත් ලබා දෙන මෙත් සවිය කඳවුර වැල්ලවත්ත, ශ්‍රී විජයාරාමයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පැවැත්වේ. සියළු සාමාජිකයින් සහ සාමාජිකයින්ගේ පවුල් වල අයටත්, අසල්වාසී අසරණ අයටත් පැමිණ ප්‍රතිකාර ලබාගත හැක. මෙයට ශ්‍රම දායකත්වය සැපයිය හැකි මෙත් සවිය වෛද්‍ය වරුන් හෝ හෙදියන් වෙත්නම් මහාචාර්ය චන්දන ජයරත්න මහතා (0714 800 800) හෝ කාර්යාලය (0714 014467) අමතන්න.

## 2017 පෙබරවාරි 05 වන දින මීළඟ දාන - සීල - භාවනා වැඩසටහන

2017 / 02 / 05 වන ඉරු දින **මිහින්තලය කළුදිය පොකුණ ආරණ්‍ය සේනාසනයේ දී** පැවැත්වෙන අතර ඉන් අනතුරුව ඓතිහාසික වටිනාකමකින් යුත් ගල් ගුහා හා ඉදිකටු සෑය ඇතුලු විශේෂ ස්ථාන නැරඹීම සඳහා සංචාරක උපදේශකයකුගේ මඟපෙන්වීම යටතේ සිදු වේ.

2017 පෙබරවාරි 04 වන සෙනසුරාදා රාත්‍රී 10.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් සුඛෝපබෝගී බස්රථ මගින් පිටත් වේ. පසුදින (ඉරුදින) රාත්‍රී 9.00 ට ප්‍රථම නැවත කොළඹට පැමිණීමට බලාපොරොත්තු වේ. පවුලේ සාමාජිකයන්හට ද සහභාගී විය හැක.

4 පිටුවට...

# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2016. 04. 24 සිට 2016. 09. 18 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/ C-0478 | එල්.ජී.ගීතිකා මිය | 33-5047 | 500.00 |
| 14/ C-0479/0480 | චමකා මිය | 33-5109 | 1,000.00 |
| 14/A-18076-08100 | චන්ද්‍රලතා දිසානායක මිය | 33-5035 | 2,500 |
| 14/A-18501-18525 | උදයකුමාර මයා | 03-531 | 2,500 |
| 14/A-18776-19025 | රුක්ෂාන් දිසානායක | 33-5054 | 5,000 |
| 14/E-0094 | සාගරිකා වලිසුන්දර මිය | 33-5090 | 5,000 |
| 539 | ඩිලන්ත අනුෂකුමාර මයා | 33-5190 | 15,000 |
| 14/G-0037 | රිද්මි කරුණාරත්න මිය | 29-4403 | 100,000 |
| 14/A-18101-18125 | ඩබ්.ඒ.කුමාරි මිය | 33-5037 | 2,500 |
| 14/A-18001-18025 | එල්.පි.අනුරශාන්ත මයා. | 33-5185 | 2,500 |
| 14/A-15976-16000 | එන්.එම්.ප්‍රේමකුමාරි මිය. | 32-4934 | 2,500 |
| 14/A-19276-19300 | නයනමාලි රණසිංහ මිය | | 2,500 |
| 14/A-19451-19475 | පි.රත්නපුලි මිය. | 33-5076 | 2,500 |
| 14/A-15876-15925 | නිලූකා කුමාරි මිය | 32-4933 | 5,000 |
| 14/A-18701-18750 | විජේරත්න වලිසුන්දර මයා | 33-5038 | 5,000 |
| 14/A-19176-19225 | නන්දා මනම්පේරි මිය | 33-5184 | 5,000 |
| 14/A-18551-18675 | එල්.කේ.අතුරුපාන | 33-5112 | 12,500 |
| 14/G-0038 | දිනිති මංගලා මිය | 33-5138 | 100,000 |
| KETA-0548 | සුමනා ප්‍රේමරත්න මිය | | 1,500 |
| 14/A-18176-18200 | අතුල නානායක්කාර මයා | 01-212 | 2,500 |
| 14/E-0094 | ජී.දිල්රුක්ෂි මිය | 32 | 5,000 |
| 14/D-0262 | සංජීවනී ප්‍රේමරත්න මිය | 22-3489 | 1,000 |
| 541 | නිර්මලා මොරින් ශ්‍යාමිනි මිය | 34-5246 | 5,100 |
| 14/G-0041 | අනුර ගිනිගේ මයා සහ | 33-513 | 100,000 |
| | දර්ශනී ගිනිගේ මිය | 29-4487 | |
| KETA-0550 | ඩබ්.ඒ.නන්දාවතී මිය | | 500 |
| KETA-0557 | නිලන්ත වීරසිංහ මයා | | 500 |
| KETA-0558 | මල්කාන්ති ඩයස් මිය | | 500 |
| KETA-0560 | ධම්මිකා සමරකෝන් මිය | 33-5079 | 500 |
| KETA-0561 | මානෙල් සිරිවර්ධන මිය | 33-5078 | 500 |
| KETA-0564 | ඩයනා රත්නතිලක මිය | 28-4379 | 500 |
| KETA-0566 | එච්. සෙනරත් මිය | 5-1039 | 500 |
| KETA-0606 | කුසලා අබේසේකර මිය | | 500 |
| KETA-0608 | එල්.පි.පි.ජයවර්ධන | | 500 |
| KETA-0609 | එන්.ඩී.ආර්.එල්.කුමාර මයා | | 500 |
| KETA-0551 | අනුක ද සිල්වා මිය | | 1,000 |
| KETA-0552 | එම්.ඒ.කරුණාවතී මිය | | 1,000 |
| KETA-0553 | ඩී.ආර්.ජයසිරි මයා | | 1,000 |
| KETA-0554 | ඊ.තලගල | | 1,000 |
| KETA-0555 | ලසන්ත පෙරේරා මයා | 14-2419 | 1,000 |
| KETA-0556 | එච්.සුජීවනී මිය | 28-4253 | 1,000 |
| KETA-0559 | දිනිති විජෙසේකර මිය | 33-5212 | 1,000 |
| KETA-0563 | චන්ද්‍රානි සමරකෝන් මිය | 32-4946 | 1,000 |
| KETA-0605 | පි.එන්.දීපිකා මිය | | 1,000 |
| KETA-0607 | හංසන සංදීප මයා | | 1,000 |
| KETA-0549 | කමල් විජේරත්න මයා | 30-4595 | 2,000 |
| KETA-0603 | මාලනි ජයසිංහ මිය | | 3,000 |
| KETA-0562 | උචිත ජයතිස්ස මයා | 33-5153 | 5,000 |
| KETA-0565 | මාලනි ජයසිංහ මිය | 18-2951 | 5,000 |
| KETA-0604 | කේ.ඒ.ඩයස් | | 5,000 |
| 14/ C-0757 | අයි.කිර්ති මයා | | 500 |
| 14/D- | විශාකා සුධර්ශනී මිය | 31-4816 | 1,000 |
| 14/D- | පරිත්‍යාග | | 1,000 |
| 14/A-5726-5750 | මහේෂිකා දේවසුරේන්ද්‍ර මිය | 28-4252 | 2,500 |
| 14/A-18601-18625 | වසන්ත කුමාර මයා | 33-5132 | 2,500 |
| 14/A-18626-18650 | අරුණ පෙරේරා මයා | 33-5139 | 2,500 |
| 14/A-4151-4175 | ටී.පද්මිණි මිය | 30-4560 | 2,500 |
| 14/A-19276-19300 | ඩබ්.අබේසේකර | 31-4740 | 2,500 |
| 14/G-0042 | ලිවින්ස්ටන් දහනායක යුවල | 32-4914 | 100,000 |
| | | 32-4915 | |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-1045 | පරිත්‍යාග | | 100 |
| | පරිත්‍යාග | | 120 |
| 14/D-0263 | රුවිනි ලක්මාලි සුබසිංහ මිය | | 1,000 |
| 14/D-0264 | මල්ලිකා හෙට්ටිආරච්චි මිය | | 1,000 |
| 14/A-20201-20225 | ජී.කරුණාරත්න මිය | 34-5533 | 2,500 |
| 14/A-19326-19375 | නිරංජලා දිසානායක මිය | 33-5092 | 5,000 |
| 14/A-19376-19425 | රම්‍යා දීපිකා මිය | 33-5094 | 5,000 |
| 14/A-19676-19750 | රුක්ෂාන් දිසානායක මයා | 33-5054 | 5,000 |
| 14/E-0097 | සෝමලතා කලටුවාව මිය | 34-5296 | 5,000 |
| 14/A-19876 | රුක්ෂාන් දිසානායක මයා | 33-5055 | 7,500 |
| 19900/19826-19850 | | | |
| 542 | නිරංජලා සිල්වා මිය | 34-5240 | 20,000 |
| 543 | නීටා එදිරිවීර විජේසූරිය මිය | 33-5134 | 20,000 |
| 14/ C-0481 | ඉන්ද්‍ර මාලනි පෙරේරා මිය | 1-229 | 25,500 |
| 14/I-0009 | | | |
| 14/H-005 | මේබල් දසනායක මිය | 10-1844 | 50,000 |
| 14/G-0043 | හේමලතා ෆොන්සේකා මිය | 32-4926 | 100,000 |
| 14/D-0265 | දීපානි පෙරේරා මිය | | 1,000 |
| 14/D-0293/0294 | ශිරන්ත ඉලංගරත්න මයා | 19-3154 | 2,000 |
| 14/A-19626-19650 | ඩිලන්ත අනුෂකුමාර මයා | 33-5190 | 2,500 |
| 14/A-20126-20150 | පි.එස්.පෙරේරා මිය | 34-5228 | 2,500 |
| 14/A-20151-20175 | ජී..සි.නානායක්කාර මිය | 34-5212 | 2,500 |
| 14/A-20551-20575 | ඩී.ආර්.ජයසිරි මයා | 34-5264 | 2,500 |
| 545 | අනුජිත් ජයසිංහ මයා | | 10,000 |
| 544 | එස්.ජී.මධුරංග මයා ඇතුළු පිරිස | | 16,600 |
| 14/ C-0758 | නෙතලි ජයවර්ධන මිය | 34-5728 | 500 |
| 14/ C-0759 | එල්.පි.ජයවර්ධන | | 500 |
| 14/A-20376-20400 | යමුනා මානෙල් ගුණසිංහ මිය | 33-5017 | 2,500 |
| 14/A-18501-18525 | එච්.ටී.යු.පෙරේරා මිය | 33-5137 | 2,500 |
| 14/A-19601-19625 | සාවිත්‍රි වික්‍රමසිංහ මිය | 20-3278 | 2,500 |
| 14/A-20476-20500 | ඩී.අයි.වෙත්තසිංහ මිය | 19-3182 | 2,500 |
| 14/A-20801-20825 | එම්.ජී.එම්.ද .සිල්වා මිය | 34-5338 | 2,500 |
| 14/A-20826-20850 | සීතා අමරවික්‍රම මිය | 34-5285 | 2,500 |
| 14/A-20876-20900 | ඉරන්ති පෙරේරා මිය | | 2,500 |
| 14/A-17201-17225 | තිලංකා සඳමාලි මිය | 32-5025 | 2,500 |
| 14/A-20001-20025 | පද්මිණි කුමාරසිරි මිය | 21-3325 | 2,500 |
| 14/A-20026-20050 | ජානකි ප්‍රනාන්දු මිය | 33-5036 | 2,500 |
| KETA-0567 | එස්.එන්.කේ.නානායක්කාර | | 2,500 |
| 14/A-19751-19800 | ජේ.සෝමලතා මිය | 33-5102 | 5,000 |
| 16/J-0001 | නිමල් කපුමුල්ල මයා සහ | 34-5222 | 101,008 |
| | සුනීතා හේරත් මිය | 34-5219 | |
| 16/J-0004 | ජස්ටින් කරදවල මයා | 11-19881 | 105,000 |
| 14/A-17596 | පරිත්‍යාග | | 100 |
| 14/ C-0760 | පරිත්‍යාග | | 500 |
| 14/A-21026-21050 | විවේකා නිල්මිණි මිය | 34-5321 | 2,500 |
| 14/A-21001-21025 | පි.එස්.පෙරේරා මිය | 34-5228 | 2,500 |
| 14/A-21101-21125 | ලක්ෂ්මී හිනටිගල මිය | 34-5169 | 2,500 |
| 14/A-20951-20975 | ජී.සි.නානායක්කාර මිය | 34-5212 | 2,500 |
| 14/A-21426-24150 | හිරන්ති පෙරේරා මිය | | 2,500 |
| 14/A-13751-13775 | කුසුම් විජේසේකර මිය | 31-4802 | 2,500 |
| 14/A-16226-16250 | පුෂ්පලතා ගුණසේකර මිය | 32-4930 | 2,500 |
| 14/A-18351-18375 | ගයනි සේනානායක මිය | 33-5170 | 2,500 |
| 16/J-0003 | ලලිත් වසන්ත මයා | 34-5298 | 10,100 |
| 14/D-0295 | පි.ජී.ලලිත් මයා | 14-2440 | 1,000 |
| 14/A-21201-21225 | යමුනා මානෙල් ගුණසිංහ මිය | 33-5017 | 2,500 |
| 14/A-17801-17825 | එන්.අයුවර්ධන මිය | 20-3218 | 2,500 |
| 14/A-21376-17825 | සම්පත් හිරිඇල්ල මයා | 34-5304 | 2,500 |
| 14/A-20851-20875 | ජී.ජයවර්ධන මිය | 34-5231 | 2,500 |
| 14/ C-0482 | එච්.ජී.කේ.එදිරිසිංහ | | 500 |
| 14/A-19925-19950 | ශ්‍යාමලී කුරුප්පු මිය | 34-5592 | 2,500 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. | ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 14/A-19501-19525 | ඉසංගිකා රත්නායක මිය | 33-5052 | 2,500 | 14/ F-0068 | කේ.ජ්.ඩයස් මයා සහ එම මහත්මිය | 34-5253 | 10,000 |
| 14/A-20326-20350 | තරංග චතුරංග මයා | 34-5227 | 2,500 | 14/A-24026-24035 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 1,000 |
| 14/A-16876-16900 | නිලංගනී මිය | 32-4938 | 2,500 | KETA-0610 | දහනායක මයා | | 1,000 |
| 14/A-20401-20425 | දිලිනි සෙනාලි සිල්වා මිය | 34-5323 | 2,500 | KETA-0612 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 1,747 |
| 14/E-0098 | තුෂාර හේරත් මයා | | 5,000 | KETA-0611 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 3,050 |
| 14/G-0044 | ප්‍රදීප් යහම්පත් මයා | | 100,000 | 14/A-21726-23950 | ක්‍රියාකාරී කමිටුව මහියංගනයේදී | | 220,000 |
| 14/D-0296 | සජීවනි ප්‍රේමරත්න මිය | 22-3489 | 1,000 | 14/A-20976-21000 | ඩබ්.එම්.පී.පී.කුමාර මයා | 22-3517 | 2,500 |
| 14/A-20901-20925 | ලසනි සදුනිකා මිය | 34-5330 | 2,500 | 14/A-21601-21625 | නිරෝෂනි විතාන මිය | 34-5290 | 2,500 |
| 14/A-20776-20800 | එස්.ඩී.සිල්වා මයා | 34-5267 | 2,500 | 16/J-0005 | කරුණාරත්න හේවගේ මයා | | 5,000 |
| 14/A-21651-21675 | සිරිධර්ශනී පෙරේරා මිය | 34-5228 | 2,500 | | | | |



# බුදුපිළිම කමිටුව පුළුල්කර පිහිටුවීම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම

බුදුපිළිම වහන්සේ තැනීම සඳහා මදිපාඩු මුදල් දෙස් විදෙස් පින්වතුන් සහ ආයතන වෙත ලිපි යවා එකතු කිරීම, මාධ්‍ය ආවරණය ඇතුළු විවිධ කාර්යයන් රාශියක් ඉදිර වසර ඇතුලත නිම කළ යුතු බැවින්, මෙම මහා පුණ්‍යකර්මයට ඍජුව ශ්‍රම දායකත්වය දිය හැකි සාමාජිකයින් නොපමාව 2016 ඔක්තෝම්බර් මස 30 වන දිනට පෙර තම නම, දුරකථන අංකය හා සාමාජික අංකය සභාපති තුමා වෙත හෝ කාර්යාලයට ලබාදෙනමෙන් ඉතා කාරුණිකව ඉල්ලාසිටිමු.

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

2 පිටුවෙන්...

**2017 ජනවාරි 15 ට පෙර බස්රථ සඳහා බරපැන කාර්යාලයට ලබා දෙන්න.** විස්තර කාර්යාලයෙන් ලබා ගන්න.

### 2017 / 02 / 29 මීළඟ 26 වන භාවනා වැඩසටහන

2017 පෙබරවාරි මස 19 දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2017/01/31 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තව ද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමපිකයන්ට ද ඒ සඳහා සහභාගී විය හැක. සාමපිකත්වය අළුත් කරගන්නාවිට භාවනා වැඩසටනට පැමිණෙන / නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

### 2016 මාර්තු 05 වන ඉරු දින සාර්ථකව ඉගෙනීම හා විභාග සමත්වීමේ නවීන ක්‍රමවේද පිළිබඳ වැඩමුළුව

මෙදින මාසික රැස්වීම වෙනුවෙන් වසරකට වරක් මහාචාර්ය චන්දන ජයරත්න මහතා මෙත් සවිය සංසදයේ සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පවත්වනු ලබන මෙම වැඩමුළුවට ඉරිදා ප.ව. 1.00 සිට 5.00 දක්වා බොරැල්ල තරුණ බෞද්ධ සංගම් ශාලාවේ දී (බොරැල්ල YMBA) සහභාගි විය හැකිය. සාමාජිකයකු සමඟ පැමිණෙන විට (ළමුන් තනිව පැමිණෙන්නේනම් උප්පැන්නයේ පිටපතක් හා සාමාජිකයාගේ ලිපියන් රැගෙන ආවිට) සාමපිකයාගේ ළමුන්ට නොමිලේ සහභාගි විය හැකිය. එක් සාමාජිකයෙකුට එක මුද්‍රිත සටහනක් පමණක් සැපයේ.

සාමපික නොවන සිසු සිසුවියන්ට හා වෙනත් වැඩිහිටි අයට ද සහභාගී විය හැකි අතර මුද්‍රිත ද්‍රව්‍ය හා ශාලා ගාස්තු සඳහා යන බරපැන පියවීම සඳහා එක් අයෙකුට රු. 500/- මුදලක් එදින දී ආයෝජනය කළ යුතු වේ. මේ සඳහා 2017 - 02 - 29 දිනට පෙර කාර්යාලයට අමතා - 0714 4014467 / 0112 50 50 88 ලියාපදිංචි වන්න.

වයස 12 ට වැඩි ඕනෑම අයෙකුට සහභාගී වී පාඩම් කිරීමේ නවීන ක්‍රම, වේගයෙන් ලිවීමේ කියවීමේ නවීන ක්‍රමවේද, ඉගෙනීමට බාධාවන මානසික රෝග හඳුනාගැනීම, මතකය වර්ධනය සඳහා ක්‍රියාමාර්ග, බුද්ධි වර්ධන අභ්‍යාස, කාලසටහන් තැබීම, ස්වයං යෝජනා ක්‍රම හා විභාගයක දී සමත්වීමට පිළිතුරු ලියන පිළිවෙල ආදී වැදගත් කරුණු රාශියක් දැනගත හැකිය. මිනිසා විසින් උපතේ සිට මරණය දක්වා ම නොකඩවා සිදුකරන ක්‍රියාවලියක් වන ඉගෙනීම නිපි පරිදි සිදු කරන අයුරු පැහැදිලි කරන මෙම වැඩමුළුව ළමා හා වැඩිහිටි සියලු දෙනාටම වැදගත් ය.

### 2017 අප්‍රේල් 02 මෙත් සවිය වාර්ෂික මහා සභා රැස්වීම, ධර්ම දේශනාව හා මෛත්‍රී භූෂණ සම්මාන උළෙල

මෙදින ප.ව. 2.00 - 5.00 දක්වා මෛත්‍රී භූෂණ සම්මාන උළෙල ද, ප.ව. 3.30 - 4.30 දක්වා සුප්‍රකට ධර්ම දේශකයාණන් වහන්සේ නමකගේ ධර්ම දේශනාවක් ද පැවැත්වේ.

මෙත් සවිය 14 වන වාර්ෂික මහා සභා රැස්වීම හා 2016 අයවැය ඉදිරිපත් කිරීම හා නව නිලධාරී මණ්ඩලය පත්කර ගැනීම 2016 අප්‍රේල් මස 02 වන දින සවස 4.30 ට පැවැත්වේ. වැඩි විස්තර පසුව දැනුම් දෙනු ලැබේ.

# කෙලෙස් 1500

සිත කිලිටි කරන නරක් කරන තවන අකුශල පාක්ෂික චෛතසික ධර්මයෝ **කිලේස** නම් වෙති. **කෙලෙස්, ක්ලේශ** යන මේවා ද ඒවාට කියන නම් ය. එක්දහස් පන්සියයක් ලෙස ගණන් ගෙන ඇති කෙලෙස් සියල්ල විභාග වශයෙන් දක්වා ඇති යම්කිසි එක් සූත්‍රධර්මයක් නැත්තේය. එබැවින් කෙලෙසුන්ගේ ගණන අඩුවැඩි නැති ව හරියට ම දැක්වීම අපහසුය. එක්දහස් පන්සියය යන මේ ගණන සාමාන්‍ය ගණනෙකි. සිත කිලිටි කරන ධර්ම සියල්ල තථාගතයන් වහන්සේ විසින් දේශනය කර ඇත්තේ ක්ලේශ යන නාමයෙන් ම නොවේ. **උපක්කිලේස කිලේස අංගණ චේතොඛිල ආසව ඕඝ යෝග නීවරණාදි** නොයෙක් නම් වලින් සූත්‍ර පිටකයෙහි හා අභිධර්ම පිටකයෙහි නොයෙක් තැන්වල නොයෙක් සූත්‍රවල සිත කිලිටි කරන ධර්ම දේශනය කර ඇත්තේය. එක් දහස් පන්සියය යන ගණන කියන්නේ ඒවා ක්ලේශ යන නමින් එකතු කර ගැනීමෙනි. ආචාර්‍ය්‍යවරයන් විසින් කෙලෙස් එක්දහස් පන්සියය දක්වන ක්‍රම කීපයක් ඇත්තේය. අභිධර්මපිටකයේ ඛුද්දකවත්ථුවිභංගයේ හා බ්‍රහ්මජාලසූත්‍රයෙහි දැක්වෙන් කරුණු අනුව කෙලෙස් එක්දහස් පන්සියය දැක්වීම ඉන් එක් ක්‍රමයෙකි. මේ ග්‍රන්ථයෙහි කෙලෙස් එක්දහස් පන්සියය විස්තර කරන්නේද ඒ ක්‍රමයෙනි.

ලෝකෝත්තර මාර්ගයෙන් මතු කිසිකලෙක නැගී නො එන පරිදි කෙලෙසුන් සහමුලින් ම නසා නැති පෘථග්ජන පුද්ගලයන් තුළ මේ කෙලෙස් එක් දහස් පන්සියය ම යටපත් වී පවත්නේය. එහෙත් පෘථග්ජන චිත්තය නිරන්තරයෙන් ම කිලිටි වී පවත්නේ නොවේ. සිත කිලිටි වන්නේ යටපත් වී ඇති කෙලෙසුන්ගෙන් යම්කිසිවක් නැගී ආ විට ය.

අළු යට ගිනි අඟුරු ලෙසින්, ඇති බව නො දැනෙන පරිදි යටපත්ව පවත්නා අවස්ථාවය. ඇති බව දැනෙන පරිදි මතුවී පවත්නා අවස්ථාවය. ක්‍රියා කරන අවස්ථාවයයි **කෙලෙසුන්ගේ අවස්ථා තුනක්** ඇත්තේය. රාගාදි කෙලෙසුන් ඇතිවීමට හේතු වන රූපාදි ආරම්මණයන් ලද කල්හි ඒ කෙලෙසුන් ඇති වන්නේ ඒවා ඒ පුද්ගලයාගේ සන්තානයෙහි යටපත් වී තිබීම නිසාය. අනාගාමි මාර්ගයෙන් කාමරාගය සම්පූර්ණයෙන් ම නැති කරනු ලැබේ. එබැවින් අනාගාමි අර්හත් පුද්ගලයන්ගේ සන්තානවල යටපත් ව පවතින කාමරාගයක් නැත. කාමරාගයට ආහාරය වන ස්ත්‍රී රූපයක් දැකීමෙන් හෝ ශෝභන තරුණියක හා කථා කිරීමෙන් හෝ එක් ව විසීමෙන් හෝ එක්ව ශයනය කිරීමෙන් හෝ අනාගාමි අර්හත් පුද්ගයන්ට කාම රාගයක් ඇති නො වන්නේය. එයට හේතුව ඒ පුද්ගයන් තුළ යටපත්ව පවතින කාම රාගයක් නැතිබව ය. පෘථග්ජන පුද්ගයන්ට වනාහි ලස්සන තරුණියක් ගැන ඇසූ පමණින් වුවද කාම රාගය ඇති වේ. එයට හේතුව ඔවුන් තුළ කාම රාගය නමැති ක්ලේශය යටපත්ව තිබීමය. ධර්ම විභාග නොදත් පුද්ගලයෝ තමන් තුළ කෙලෙස් ඇති වුව ද ඒ ඇති වුන දේවල් කෙලෙසුන් බව නොදනිති. ශෝභන තරුණිය දුටු තරුණයා කෙරෙහි තරුණිය ගැන ආදරයක් ඇති වේ. ඇය නැවත නැවත දැකීමේ ආශාවක් ඇයට සංග්‍රහ කිරීමේ ආශාවක් ඇති වේ. තරුණයා තුළ ඇතිවන ඒ ආදරය හා ආශා රාශිය කාමරාගය නමැති ක්ලේශයය. ස්ත්‍රී රූපයෙන් නිසරු බව සැලකීමෙන් හෝ රාගයේ ආදීනවය සැලකීමෙන් හෝ අන් වැඩක යෙදීමෙන් හෝ ඒ නැගී සිටි කාමරාගය නමැති ක්ලේශය යටපත් නොකළහොත් එය වැඩි ක්‍රියාකාරි භාවයට පැමිණෙන්නේය. ඔහු දුටු තරුණිය වෙත යන්නේය. ඇය හා කථා කරන්නේය. එයට විරුද්ධ වන අය හා කලහ කරන්නේය. ඇය සතුටු කරවීම සඳහා ප්‍රාණවධාදි නොයෙක් පව්කම් ද කරන්නේය. ඒ කාමරාගය නමැති ක්ලේශයේ කියා කරන අවස්ථාවය. කියන ලද ක්‍රමයෙන් සියලු කෙලෙසුන්ගේ ම අවස්ථා තුන තේරුම් ගත යුතුය. පත්ළෙහි මඩ ඇති ලිදේ ජලය නොකැළඹෙන තෙක් පිරිසිදු ය. එමෙන් එක් දහස් පන්සියයක් කෙලෙසුන් සිතෙහි යටපත් වී ඇත ද ඒවායින් කවරක් හෝ නැගී එන තුරු සිත පිරිසිදුය. සිත අපිරිසිදු වන්නේ නැගී සිටියාවු ද ක්‍රියාකාරිත්වයට පැමිණියා වූ ද කෙලෙසුන්ගෙනි. කෙලෙස් යටපත් වී පවත්නා තෙක් පුද්ගලයාගෙන් පාපායක් නොකෙරේ. සියලුම පව් කෙරෙන්නේ නැගී සිටියා වු කෙලෙසුන් නිසාය. බොහෝ පින් ඇති පුද්ගලයකු වුවද මරණාසන්න කාලයේ කෙලෙසුන්ගෙන් දූෂිත වූ සිතින් විසුවහොත් ඔහු පින් ඇත ද නරකයෙහි උපදනා බව

**"චේතොපදෙස හෙතු පන භික්ඛවේ එවම්ධෙකච්චෙ සත්ත කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති"**

(අංගුත්තර ඒකකනිපා)

යනුවෙන් වදාරා ඇත්තේය. කෙලෙසුන් ගෙන් සිත දූෂිත වීම ඉමහත් නපුරක් බැවින් එසේ නොවන පරිදි පරෙස්සම් විය යුතුය. පරෙස්සම් වීම නම් බුදුන් වහන්සේ විසින් දේශිත ධර්මය සේවනය කිරීම හා සිහියෙන් යුක්තව විසීමය. එසේ වාසය කරන සත්පුරුෂයන්ගේ සිත්වල කෙලෙස් නැගී සිටීම අඩුය. පෘථග්ජන පුද්ගලයාට සැම කල්හිම සිහියෙන් යුක්ත විය නොහෙන බැවින් ගිහිගෙය හැර පැවිදිව වනගතව මහණදම් පුරන පින්වතුන් තුල ද සමහර විට කෙලෙස් මතු වේ. එසේ මතු වන්නා වු කෙලෙසුන්ගේ ඒ පින්වත්හු වහා සන්සිඳවා ගනිති. ඒ ජාතියෙහිදී ම රහත් වීමේ බලාපොරොත්තුවෙන් අතීතයේ මහණදම් පිරූ ඇතැම් භික්ෂු ගමනෙහිදී උපන් ක්ලේශය ගමනෙහිදීම ද සිටිමේදී උප ක්ලේශය සිටීමේදී ම ද හිඳීමෙහි දි උපන් ක්ලේශය හිඳීමෙහිදී ද ශයනයෙහිදී උපන් ක්ලේශය ශයනයෙහිදී ම ද සන්සිඳුවා ගනිමි. මහණ දම් පිරූ බව දහම් පොත් වල සඳහන් ව ඇත්තේය. සාමාන්‍ය ජනයාගේ සිත් නිතරම පවතින්නේ කෙලෙසුන් ගෙන් දූෂිතවය. කෙලෙසුන් නොහඳුනන බැවින් ඔවුහු ඒ බව නො දනිති. එබැවින් ඔවුහු උපන් ක්ලේශය සන්සිඳවීමට උත්සාහ නොකෙරෙන කෙලෙසුන් නැගී නො එන ලෙස විසිය හැකි වීමට හා උප ක්ලේශය දුරු කර ගත හැකි වීමට කෙලෙසුන් හැඳින ගත යුතුය.

## කෙලෙස් එක් දහස් පන්සියය සැකෙවින් දැක්වීම

විභංගප්‍රකරණයේ ඛුද්දකවත්ථු විභංගයේ -

| | |
|---|---|
| **එක බැගින් දැක්වෙන ධර්ම** | **73** |
| **දුක වශයෙන් දැක්වෙන ධර්ම** | **36** |
| **ත්‍රික වශයෙන් දැක්වෙන ධර්ම** | **105** |
| **චතුෂ්ක වශයෙන් දැක්වෙන ධර්ම** | **56** |
| **පඤ්චක වශයෙන් දැක්වෙන ධර්ම** | **75** |
| **ෂට්ක වශයෙන් දැක්වෙන ධර්ම** | **84** |
| **සප්තක වශයෙන් දැක්වෙන ධර්ම** | **49** |
| **අෂ්ටක වශයෙන් දැක්වෙන ධර්ම** | **64** |
| **නවක වශයෙන් දැක්වෙන ධර්ම** | **81** |
| **දශක වශයෙන් දැක්වෙන ධර්ම** | **70** |
| **බ්‍රහ්මජාල සූත්‍රයෙහි දැක්වෙන දෘෂ්ටි ධර්ම** | **62** |
| **එකතුව** | **755** |

මේ ධර්ම සත්සිය පස්පනස උත්පන්න අනුත්පන්න භේදයෙන් ගන්නා කල්හි එක්දහස් පන්සිය දසයක් වේ. නොයෙක් නම් වලින් දේශනය කර ඇත්තා වු ඒ සියල්ලෝ ම සිත කිලිටි කරන ධර්මයෝ ය. අධික වු දශය ගණනට නොගෙන ඒ ධර්ම සමුහයට කෙලෙස් එක්දහස් පන්සියයි කියනු ලැබේ. මේ ධර්මසංගණී මුලටිකාවේ දක්වා ඇති ක්‍රමය ය.

**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ ලිපියක් ඇසුරිනි.**

# දහතුන් වසරක මෙතෙක් අප ආ ගමන් මගෙහි නොමැකෙන පිය සටහන් වලින් බිඳක්...

- 2003 - 06 - 08 දින කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශි බෞද්ධාශ්‍රමයේ දී පළමු ත්‍රෛමාසික භාවනා වැඩ සටහන ඇරඹීම හා මේ වන විට සසර දුකින් ගැලවීමට වෙර දරන පිංවතුන් 5,550 කට ආසන්න ප්‍රමාණයකට විදර්ශනා භාවනාව හා හතලිස් කමටහන් සහිත සමථ භාවනාව පුහුණු කරවීම.
- භාවනාවේ ප්‍රයෝජන සම්බන්ධව විද්‍යාත්මක පර්යේෂණ පවත්වන ඒ පිළිබඳ ලංකාවේ පිහිටි මුල්ම පර්යේෂණ අංශය පිහිටුවීම.
- සංසදයේ ප්‍රථම අසරණ සරණ වැඩසටහන වෙනුවෙන් මතුගම බිලිගහ අසරණ පවුලකට නිවසක් තනා දීම. (2003.09.19)
- ඇඹුල් ගම රජමහා විහාරස්ථානයට සක්මන් මළුවක් සාදා පූජා කිරීම. (2005. 05. 15)



● මෙත් සවිය ලේ දන්දීමේ පුණ්‍යෝත්සවය (2004. 05. 30)







● සුනාමියෙන් විපතට පත් වූවන් සඳහා 2004. 12. 27 සිට 2004. 12. 30 දක්වා වෛද්‍ය කඳවුරු 20 ක් පැවැත්වීම සහ ලක්ෂ 6 කට වැඩි භාණ්ඩ බෙදා දීම.

- ගල්දූව ආරණ්‍යයේ ආවාස ගෙයහි පොළවට ටයිල් ඇල්ලීම.
- දාන - සීල - භාවනා වැඩ සටහනක දී රු. 34,000/- ක් වටිනා පොත් 55 කින් යුත් ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව රාජගිරියේ තපෝ වනය භාවනා මධ්‍යස්ථානයට පූජා කිරීම. (2006. 01. 01)





- පිළිකුත්තුව රජමහා විහාරයේ වැසිකිළි පෙළක් තනා සඟ සතු කර පූජා කිරීම සහ දහම් පාසලට ලී බඩු පූජා කිරීම.





- මිරිසවැටිය සළපතල මළුවේ ගල් ඇතිරීම ආරම්භ කිරීම. (2007. 02. 14)



- අනුරාධපුරය ජේතවනාරාමයට පරිගණයක් සඳහා UPS බල සැපයුම් යන්ත්‍රයක් පූජා කිරීම. (2007. 02. 04)





- මෙත් සවිය සාමාජිකයින් විසින් අසරණ සරණ සඳහා පිං කැට වලට එකතු කරන ලද රු. 83,900/- මුදලින් ගවයන් නිදහස් කිරීම. (2007. 05. 13)





- මෙත් සවිය මගින් දඹාන හා දිඹුලාගල ආදී වාසීන් සඳහා නිවාස තනා දීමේ පළමු අදියර 2007. 05. 26 / 27 යන දිනයන් හි සිදුකරන ලදී.






- සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද පිළිබඳව වැඩමුළුව 2008. 04. 06 දිනෙන් ආරම්භ කර නොකඩවා සෑම වසරක් පාසාම පැවැත්වීම.




- අපගේ ගරු සභාපති තුමන් මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් සහ ගරු සාමාජික අරිසෙන් අහුබුදු ශූරීන් අතිගරු ජනාධිපති තුමන් සහ අගමැතිතුමන් හමුවී සත්ව හිංසනය වැලැක්වීම පිළිබඳව නීතිමය පියවරක් ඉල්ලා සිටීමේ අත්සන් ලක්ෂයකින් යුත් ලියවිල්ල භාර දීම (2008). **මේ වන විට එම නීති සංශෝදනය වී බොහෝමයක් ක්‍රියාවට නංවා ඇත.**




- හම්බන්තොට අති දුෂ්කර පාසලක් වන සූරියවලාන විදුහලේ පරිගණක විද්‍යාගාරයක් තැනීම සඳහා පරිගණක හතරක් ලබා දීම. (2010)



- යුද්ධය නිමා වී මාස 6 ක් යාමට පෙර ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් සඳහා අත්‍යවශ්‍යව තිබූ වැසිකිළි පද්ධතියක් හා ජල ටැංකි නාගදීප විහාරස්ථානයට පූජා කිරීම. (2010)



- අසරණ රෝගීන් සඳහා නොමිලේ රෝදපුටු හා කිහිළි කරු පරිත්‍යාග කිරීම.




- නාගදීප වන්දනාවේ යන දකුණේ බැතිමතුන්ගේ පහසුව සඳහා කිළිනොච්චි විහාරස්ථානයේ වැසිකිළි පද්ධතියක් සාදා පූජා කිරීම.



- වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ පැරණි ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණය කර භාරදීම.




- අංගොඩ මානසික රෝහලේ 21 වන වාට්ටුවට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම හා ඉඳගැනීම සඳහා එළිමහනේ බංකු සවිකිරීම.



- 2011 වසරේ දී රුපියල් ලක්ෂ 5 ක පමණ වියදමින් මහියංගන රාජ මහා විහාර පුණ්‍ය භූමියේ ඉදි කරන ලද ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසකට එකවර පෙරණ ලද පිරිසිදු ජලය සැපයිය හැකි නවීන තාක්ෂණය පදනම් වූ ජල පෙරණ සහිත පානීය ජල ව්‍යාපෘතියේ අවස්ථා කීපයක්.




- වාර්ෂිකව ගංගාරාමයට ජනවාරි මස පළමු දින වසරේ ප්‍රථම දානය පූජා කිරීම.



- අක්ෂි සායන පවත්වා නොමිලේ ඇස් කණ්නාඩි ලබා දීම.




- ශබ්ද වාහිනී යන්ත්‍ර, කලුවාලෙ පංචකප දූපතේ ආරාමයට කිරීම හා එහි ධර්මශාලා වහලය තනා දීම.



- මෛත්‍රී භූෂණ සම්මානයෙන් පිදිය යුත්තන් පිදීම





- බොරැල්ල ජයන්ති ළමා නිවාසයේ සිටින අසරණ ළමුන්ට ආහාර ඇතුළු අවශ්‍ය කළමණා පරිත්‍යාග කිරීම.






- කොළඹ ජාතික රෝහල, මහරගම පිළිකා රෝහල, නයනාරෝග්‍ය ශාලාව හා රිජ්වේ ළමා රෝහල් වලට බුදුපිළිම, බෙහෙත් හා වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම.












- බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදුකල මහියංගන රාජමහා විහාරයේ අඩි 84 ක් උසැති 2600 සම්බුද්ධ ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ තැනීමේ කටයුතු 2012. 01. 08 වන දුරුතු පෝදා ආරම්භ කර ඉදිකිරීමේ කටයුතු කරගෙන යාම.






- වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමයේ දී 2004 මැයි 12-18 වෙසක් සතිය තුළ පැවැත් වූ ප්‍රථම නේවාසික වැඩසටහන



# කිපීමෙන් තොරව ඉවසීමේ ගුණය හෙවත් ඛන්ති පාරමිතාව වැඩීම.

**ඛන්ති - ඛන්ති යනු ඉවසීමයි.** ඛන්ති පාරමිතාවක්ය. එය දස පාරමිතා අතර හයවැනි පාරමිතාව ය. තම ශරීරයේ ඇතිවන ශාරීරික වේදනා, කුසගිනි, පිපාස, අනුන්ගේ නපුරු වචන, යනාදිය කෙනෙකුට ඉවසීමට හැකි නම් ඒ තැනැත්තාගේ ඛන්ති පාරමිතාව දියුණු මට්ටමක ඇත. සමාජයක ජීවත්වෙන විට හොඳ පුද්ගලයන් අතර මේ ඛන්ති පාරමිතාව දියුණු කිරීමට අවස්ථාවක් නැත. නමුත් නපුරු වචන කියන, නපුරු ක්‍රියා කරන, රළු බසින් බණින ඊටත් වඩා භයානක අත්පා දඬු මුගුරු ආදියෙන් ගසා දමා කරදර කරන පුද්ගලයන් අතර ඛන්ති නැමති පාරමිතාව පුරුදු කිරීමට දියුණු කිරීමට හැකිවෙයි. මෙම කාරණාව චරියාපිටක අට්ඨ කථාවෙහි හොඳින් පැහැදිලි කරයි.

**''කරුණුපාය කෝසල්ල පරිග්ගහිතං සත්ත සංඛාරාපරාධ සහනං අදෝසප්පධානෝ තදාකාරප්පවත්තනෝ චිත්තුප්පාදෝ ඛන්ති පාරමිතා''**

කරුණාවෙන් හා උපාය දන්නා නුවණින් සිහිය පිහිටුවාගෙන සත්ත්වයන් කෙරෙහි නොකිපීම ද, තමාට අයිති දේවල් විනාශ කරන විට නොකිපෙන ගතිය ද, මෙයාකාර අනුන්ගේ අපරාධ සිහියෙන්, නොකිපෙන නුවණින් යුක්තව එයාකාරයෙන් සිතේ වෙනසක් නො කරගෙන, ද්වේෂය පහළ නො කරගෙන යම් කෙනෙක් පවතිනවා ද එය උසස් ගුණයක් වන ඛන්ති පාරමිතාව නම් වේ. ඒ ඉවසීම අපි ක්‍රමයෙන් පුරුදු කිරීමට අවශ්‍ය ය. අපේ ශරීරයට දැනෙන හැම දුකක් ම ඉවසීමත් ඛන්ති පාරමිතාවට අයත් ය. අපගේ හිත් රිදවන්ට අනුන් කියන නපුරු වචන, අනුන්ගේ සැඩ ගති ඉවසීම ඛන්ති පාරමිතාවට අයිති වේ. තමන්ගේ හිතවතාට අනුන් කරනු ලබන දෝෂාරෝපණ හිතවතාගේ දේපල වලට කරන විනාශය, ඉවසන්නට පුරුදු වෙනවා නම් ඒක උසස් ඛන්ති පාරමිතාවක් වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා. උන්වහන්සේ දියුණු කරගෙන පැමිණි මේ ඉවසීම් ගුණයක් වන ඛන්ති පාරමිතාව බුදුරජාණන් වහන්සේගේ උපරිම තත්ත්වයට දියුණු වී තිබුණි.

ඉය හොඳට පැහැදිලි වෙන අවස්ථාවක් තමයි අළව් යකු දමනය. යක්ෂයාගේ විමානයට තමන් වහන්සේ වැඩම කර ඔහුගේ ආසනයේ වැඩහිඳ සෙසු පිරිසට දහම් දෙසමින් වැඩහුන් සේක. මෙය දැක ආලවක යක්ෂයාට තද කිපීමක් බලවත් කෝපයක් පැමිණියේ ය. ඒ නිසා බුදුරජාණන් වහන්සේට මෙසේ කිව්වේ ය. **''ශ්‍රමණයන් වහන්ස, ඇතුල් වෙන්න''** යැයි කියා සිටියේ ය. ඔය ආකාරයෙන් තුන් වතාවක් මේ ආලවක යක්ෂයා අන්වහන්සේට පිට වෙන ලෙසත් ඇතුල් වෙන ලෙසත් කිව්වේ ය. ඔහු කියන ඒ අවස්ථා තුනේ දී ම උන්වහන්සේ ඒ ඇතුල්වීම් පිටවීම් සිදුකළ සේක. උන්වහන්සේට මෙම අවස්ථාවේ කෝප මාත්‍රයක්වත් පහළ වූයේ නැත. මෙයට හේතුව උන්වහන්සේගේ ඛන්ති පාරමිතාව සීයට සීයක් උපරිම ආකාරයෙන් දියුණු වී තිබූ බැවිනි. ඔය ඛන්ති පාරමිතාව හෙවත් ඉවසීම ඇතිවිට නුවණින් එතැන පිහිටයි. නුවණ තියන තැන ඉවසීමත් ඇතිවේ.

ඒ නිසා ඉවසීම, නුවණ කියන ගුණාංග දෙක එදා බුදුරජාණන් වහන්සේගේ උපරිම තත්ත්වයෙන් දියුණු වී තිබුණි. එයට මහා කරුණා ගුණයත් මිශ්‍ර වීම නිසා ඒ අළව් යක්ෂයා පින් ඇති කෙනෙක් ඔහුට මගඵල ලබාදෙන්න ඕනෑ කියන කරුණා ගුණය නිසා උන්වහන්සේට එදා ඉවසීම ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

මේ කාරණාව ගැන අද සමාජයේ අප අතර බැලූ විට යම් කිසි නිවසකට හෝ විහාරස්ථානයකට අපි ගිය වෙලාවට එහි නිවැසියෙක් අපිට එළියට යන්න යැයි කිපුණු ගතියකින් යුතුව කියා සිටියේ නම් අපිට තදබල හිත් පීඩාවක් වෙනවා ද? අපි එයින්ම බැහැර වෙන්නෙමු. නැවත ඇතුල් වේන කීවත් අපි ඇතුල් නො වන්නෙමු. මුළු ජීවිතයට ඔවුන්ගේ නිවසට අප ඇතුල් නොවෙනවා වෙන්න පුළුවනි. ඒ අපේ නොදියුණු තත්ත්වයෙන් තේරුම් ගන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේගේ මේ ඉවසීම් ගුණය නිසා අළව් යක්ෂයාත්, අළව් නුවර බොහෝ ජීවිතත් ගළවාගන්ට ලැබුණි. මේ තමා ඛන්ති හෙවත් ඉවසීමේ ආනිශංසය.

අළව් යක්ෂයා සම්බන්ධව බලන විට ජීවිත රාශියක් ඔහුට බිළිවිය. බිළිවෙන්න තිබුණ ජීවිත රාශියක් බුදුරජාණන් වහන්සේගේ ඉවසීම නිසා බේරාගැනීමට හැකිවිය. මේ හේතුවෙන් ස්වභාවය මේ ආකාරය ය. මෙය සම්බන්ධ අතීතය පිළිබඳ විමසා බැලීමට නම් පෙර ආත්මයක් සම්බන්ධව බැලිය යුතුව ඇත.

පෙර ජාතියක දියබරියෙක් මතට දිමි ගොටුවක් වැටී මේ දිමියන් රැළ දියබරියා හපාකන්ට පටන් ගත්හ. දියබරියාට බලවත් වේදනාවක් ඇතිවිය. වේදනාවෙන් පෙළෙන දියබරියා දිමියන් කෙරෙහි වෛරයකුත් ඇතිකරගත්තේ ය. එනම් **''මම කවදා නමුත් මොවුන් කා දමා විනාශ කරන්නෙමි.''** කියන වෛර චේතනාව ය. තිරිසන් සතාගේ

උනත් වෛරය මතු ඵලදෙන ස්වභාවයක් ඇත. දියබරියා ළඟට පැමිණි ළමයෙක් කෝටු කෑල්ලකින් දිමියන් ඉවත් කර ඔහුට කරුණාවෙන් සහනයක් ලබා දුන්නේ ය. ළමයාටත් ඇතිවූයේ හොඳ හිතක්, කරුණා ගුණයක්. එහිත් මතු ඵලදෙන ස්වභාවයක් තිබුණි. මේ ළමයාත් දිමි රෑලත් දියබරියාත් සසරට එකතු වී ජාති ජාති ඔවුන් සසරේ ගත කළහ. ඒ එන ගමනේ දී දියබරියා අළවි යක්ෂයා වශයෙන් උපත ලැබුවේ ය. ඔහුට යක්ෂයන් අතර යක්ෂ සේනාධිපතිකමකුත් ලැබුණි. එදා ඒ කුමාරයා අළවි නුවර රජ්ජුරුවන්ට පුතෙක්ව උපත ලැබුවේ ය. දිමිරැළ අළවි නුවර වැසියන් වශයෙන් උපත ලැබූහ. මෙය තමයි කර්මයේ විපාක විඳින්නට ඔවුනොවුන් නැවත කර්මයෙන් ම සකස් වී සසරේ එන ආකාරය. අළවි නුවර රජතුමා පිරිසක් සමග විනෝදයට දඩයමේ ගියේ ය. රජතුමා ළඟින් මුවෙක් පැන යන විට විද ඔහු බිමහෙලා ගත්තේ ය. තමන් දඩයම් කරගත් සතා පිරිසට පෙන්වුවොත් වඩා සතුටු වේයැයි සිතා රජතුමා බිම හෙළාගත් මුවා තමා ම ගෙනාවේ ය. රජතුමා එන වෙලාව මද්දහන් වෙලාව. වෙහෙසයි. මුවාත් රැගෙන එන අතර ගහක් මුල මුවා තබා වෙහෙස නිවාගත්තා. මේ වෘක්ෂය තමයි අළවි යක්ෂයාගේ විමානය. ඒ ගහ ආශ්‍රිතව තමයි අළවි යක්ෂයාගේ විමානය තිබෙන්නේ ඔහුට සතරවරම් දෙවියන්ගෙන් වරමක් ලැබී තිබුණේ ඉර මුදුන් වෙලාවේ ගසේ සෙවණ ප්‍රදේශයට ඇතුල්වුණු සත්ත්වයෙක් බිලිගැනීමටයි.

රජතුමා මුවාත් රැගෙන එන්ට සූදානම් වන විට අළවි යක්ෂයා රජතුමා අල්ලාගෙන **''මට හොඳ ආහාරයක් ලැබුණා''**. යැයි සතුට ප්‍රකාශ කළේ ය. මරණ භයෙන් භීතියට පත්වුණු රජතුමාට කිසි දෙයක් කරගත නොහැකිව අළවි යක්ෂයාට පොරොන්දුවක් දුන්නේ ය. **''අද ඔබ මේ මුවා රැගෙන මාව බේරන්න. ඔබට දිනපතා මම බත් තලියක් හා බිල්ලකුත් එවන්නම් යම් දවසක ඒ පොරොන්දු කඩවුණා නම එදාට මාව බිළිගන්න.''** යැයි පොරොන්දු විය. මරණ බියට පත්වුණු රජතුමා ඉදිරි කාලය ගැන වැටහීමක් නැතිව මෙවැනි අඥාන බැඳීමකට බැඳුනේ ය. රජතුමා පැමිණ ඇමති මණ්ඩලය කැඳවා කාරණාව පැහැදිලි කළේය. අමාත්‍යයෙක් මෙසේ අසා සිටියේ ය. **''මහරජ, මේ දීමේ කාලසීමාවක් තියනවද?''** එවැනි පොරොන්දුවක් නොවුණ බව රජතුමා ප්‍රකාශ කර සිටියේ ය. එවැනි අදූරදර්ශී පොරොන්දුවකට රජතුමා පෙළඹුණේ එදා දිමියන් වශයෙන් සිටි සතුන් අද අළවි නුවර වැසියන් වශයෙන් ඉපිද ඔවුන් එදා දියබරියාට කළ වේදනා ඇතිකිරීමත් දියබරියාගේ බද්ධ වෛරයත් මේ විපාකයට කර්ම ප්‍රත්‍යය වශයෙන් සැලැස්වීමට ය. මේවා කාටවත් විසඳා දිමට හැකියාවක් නොමැත. ඔවුනොවුන් ගේ කර්ම ඔවුනොවුන් විඳදරා ගතයුතු බව පැහැදිලි වේ. එතැන් පටන් රජතුමා මරණයට නියම වූ මිනිසෙකුත් බත් තලියකුත් අළවි යක්ෂයාට බිලි පූජාවක් වශයෙන් දෙන්නට යෙදුනේ ය. ''මනුෂ්‍යයන්ගේ වරදවල් කිරීම නැවතුණි. මේ යක්ෂයාට බිළිවීමට ඇති බිය නිසා මනුෂ්‍යයන් වරදවල් නො කරන නිසා හිරගෙවල් පවා හිස්වී ගියේ ය. ඉන්පසු රජතුමා මහල්ලෙකුත් බත් තලියකුත් යක්ෂයාට බිළි වශයෙන් යැව්වේ ය. මේ වෙනකොට මහල්ලොත් හිඟ වී ගියහ. නැවත රජතුමා කුඩා ළමයෙකුත් බත් තලියකුත් යවන්නට පටන් ගත්තේ ය. එම නිසා ගර්භනී මව්වරු වෙනත් රාජ්‍යවලට ගොස් දරුවන් හදාවඩාගෙන නැවත ආහ. මෙසේ කල් ගතවත්ම රාජ්‍යයේ බිළි පූජාවට යවන්ට දරුවෙක් නැතිවුණි. අවසානයේ ඉතුරු වූයේ රජතුමාගේ එක ම පුතා පමණ ය. රජතුමා තම ජීවිතයට තිබෙන ආශාව නිසා තමුන් එක දවසක් ජීවත්වීමට තම එකම පුතු හෙට බිල්ලට යවන්න සූදානම් වූයේ ය.


